# අනාගත පරපුරෙන් නික්මෙන අපේ උරුමය
## (අනුරාධපුර පොලිසියේ පුරාවිද්‍යා ආරක්ෂණ ඒකකය මඟින් සිදුකරන ලද සංවිභාගයන් ඇසුරින් කළ අධ්‍යයනයකි)

එච්.එම්.එස්.කේ. හේරත්

පුරාවිද්‍යාව හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
*hmsumuduherath@gmail.com*

**ප්‍රමුඛ පද:** සංස්කෘතික උරුමය, ස්මාරක, පුරාවස්තු ආරක්ෂණ ඒකකය, පුරාවිද්‍යාත්මක වටිනාකම, ව්‍යවසනය

### හැඳින්වීම

යම්කිසි සමාජයක සංස්කෘතික උරුමය යනු එම සමාජය සතු පුරාණ ස්මාරක හා ගොඩනැඟිලි ඇතුළු චංචල හා නිශ්චල සංස්කෘතික දේපළ ලෙස හැඳින්විය හැකි ය. සෑම සංස්කෘතික උරුමයක් තුළ ම පුරාවිද්‍යාත්මක වටිනාකමක් ගැබ්ව පවතින නිසාවෙන් වසර සියයකට වඩා පැරණි සංස්කීතික වස්තූන්, ස්ථාන සහ ස්මාරක යන ඉ පැරණි මානව කෘති (1998 අංක 24 දරණ පුරාවස්තු (සංශෝධන) පනත) පුරාවස්තු හෝ පුරාවිද්‍යාත්මක ස්ථාන ලෙසින් නම් කොට තිබේ. මෙම උරුමයන් ස්වභාවික හේතුකාරකයන් නිසාවෙන් විනාශ වීම සාමාන්‍ය ක්‍රියාවලියක් වුවද අවාසනාවට සිදු වන්නේ එම ක්‍රියාවලීන් ඉක්මවාලමින් මානව ක්‍රියාකාරීත්වය මත උරුමයන් වැනසී යාමකි. මේ ක්‍රියාවලිය නොනවත්වා ක්‍රියාත්මක වුවහොත් අප රටට හිමි බොහෝ උරුමයන් අපෙන් සඳහට ම වියැකී යා හැකිය. ඒනිසාවෙන් අප සතු උරුමය වර්තමානය තුළ භාවිතයට ගනිමින් සුරක්ෂිත කර අනාගත පරපුර උදෙසා දායාද කරලීම වත්මන් පරපුරේහි වගකීමක් හා කාර්ය භාර්යක් වී තිබේ. 90 දශකයේ සිට මේ දක්වා උරුමයන් වැනසීම සම්බන්ධයෙන් පවතින තොරතුරු විමර්ශනය කිරිමෙන් අනතුරුව අනාවරණය කර ගැනීමට හැකි වුයේ මෙම ව්‍යවසනයන් බහුල ලෙස උතුරුමැද පළාත තුළ සිදුවී තිබෙන බවයි (රාජපක්ෂ, අරුණ. 2000, 57). ඒනිසාවෙන් එම පළාතේ විශාල භූමි භාගයක් තුළ පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුක්ත ඉ පැරණි වස්තූන් සහ ස්මාරක පිහිටියා වූ අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ උරුමය විනාශය කෙසේ සිදුවී තිබෙන්නේ යන්න විමසා බැලීම මෙහි දී සිදුවේ.

### ක්‍රමවේදය

උරුමන් විනාශ කිරීම් සම්බන්ධයෙන් ඇත්තේ දිගු ඉතිහාසයකි. යුරෝපීයන් විසින් ඉ පැරණි වස්තූන් එක්රැස් කිරීමේ ක්‍රියාදාමයෙන් ආරම්භ උරුම විනාශය වර්තමානයේදීත් විවිධ වූ අරමුණු පදනම් කර ගනිමින් ක්‍රියාත්මක වේ. මෙම ක්‍රියාවලීන් වළක්වා ගැනීමට අතීතයේ සිට මේ දක්වා විවිධ වූ ක්‍රියාමාර්ගයන් ගෙන තිබුණ ද එය පාලනය කර ගැනීමට නොහැකි වී ඇත. යම්කාල සීමාවක් තුළ ව්‍යවසනයන්හි වර්ධනයත් තවත් විටක එහි අවම වීමක් දක්නට හැකිවේ. මේ ක්‍රියාදාමය දිගින් දිගට සිදුවුවහොත් රටෙහි උරුමය වැනසී යනු ඇත. ඒනිසාවෙන් විනාශයන් බහුල ව සිදු වන උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ව්‍යාප්තිය සිදු වී තිබෙන ආකාරය අධ්‍යයනය කිරීම උදෙසා අනුරාධපුර පුරාවස්තු ආරක්ෂණ ඒකකය

වෙත වාර්තා වී තිබෙන තොරතුරු පාදක කර ගෙන තිබේ. එක්රැස් කරගත් දත්ත විශ්ලේෂණය කර ඉදිරිපත් කිරීම සඳහා වගු ප්‍රස්ථාර තුළින් සිදු කරනු ලැබේ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ පසුගිය වසර පහ තුළ සිදු වූ උරුමයන් වැනසීම සම්බන්ධ සියළුම තොරතුරු මෙම අධ්‍යයනය සඳහා උපයෝගී කරගෙන ඇත. වසර පහ තුළ එක්රැස් කරගත් තොරතුරු සාරාංශගත කිරීම, සැකකරුවන් අනාවරණය කරගැනීමට හැකි වූ සහ නොහැකි වූ ප්‍රමාණයන්, අයකරගෙන තිබෙන දඩමුදල් ප්‍රමාණය, සිදුකරන ලද වරදේ ස්වභාවය, අත්අඩංගුවට ගත් සැකකරුවන් විවිධ තේමාවන් ඔස්සේ වර්ග කිරීම් සහ වැනසීම උදෙසා පුද්ගලයින් සම්බන්ධ වී ඇති ආකාරය පිළිබඳ ව ලබාගත් තොරතුරු ඇසුරින් වෙන වෙනම විමසා බැලීම සිදු කර තිබේ.

## ප්‍රතිඵල හා සාකච්ඡා

යථෝක්ත පර්යේෂණයට අනුව පසුගිය වර්ෂයන් පහට අදාළව අනුරාධපුර පුරාවස්තු ආරක්ෂණ ඒකකය වෙත වාර්තා වූ සමස්ත තොරතුරු වගු අංක 1 හි දක්වා තිබේ.


මෙම තොරතුරුවලට අනුව අනාවරණය වන්නේ 2012, 2013 වර්ෂයන් දෙකේහිම වාර්තාවූ සිද්ධීන් අධික වී තිබෙන එයිනුත් 2013 වර්ෂයෙහි වැඩිවීමක් ද එම වර්ෂ දෙකට සාපෙක්ෂව අනෙක් වර්ෂවල අඩුවක් පෙන්නුම් කරයි. නඩු පැවරීම් 74ක් 2013 වර්ෂයේ, පැවරීමට නියමිත නඩු 4ක් 2015 වර්ෂයේත්, විමර්ශනය වන නඩු 48ක් 2013 වර්ෂයේ, අවසන් වී ඇති නඩු 34ක් 2016 යන වර්ෂවල වැඩි ය. ඉහත සිද්ධීන්ට අදාළ ව නීතියේ රැහැනට හසුකරගැනීමට හැකි වූ සමස්ථ සැකකරුවන් සංඛ්‍යාව 164ක් වන අතර 2013 වර්ෂයේ වැඩි ප්‍රමාණයක් අනාවරණය කර ගැනීමට හැකි වී තිබේ. මෙම වර්ෂය පහ තුළ අනාවරණය කර ගැනීමට නොහැකි වූ සැකකරුවන් ප්‍රමාණය 81ක් වන අතර ඉන් 2012 වර්ෂයේ දී වැඩි සංඛ්‍යාවක් අත්අඩංගුවට ගෙන නොමැත. පසුගිය වසර පහ තුළ අය කරගෙන තිබෙන දඩමුදල් ප්‍රමාණය හතළිස්හත් කෝටි තිස්එක් ලක්ෂ හය දහස් නවසියකි. ඉන් වැඩිම දඩ මුදලක් 2013 වර්ෂයේ අය කරගෙන තිබෙන අතර අවමය 2016 වර්ෂයේ අය කරගෙන තිබේ. වාර්තා වූ සමස්ථ සිද්ධීන් ගණන දෙසීය හතළිස් පහක් වන අතර ඔවුන් විසින් සිදුකරන ලද වරදේ ස්වභාවයන් අනුව පිළිවෙළින් පුරාවස්තු සෙවීමට කැණීම් කිරීම, පුරාවස්තු විනාශය, පුරාවස්තු සොරකම සහ පුරාවස්තු පනතට ගැනෙන වෙනත් වැරදි පෙන්වා දිය හැකි ය. වෙනත් වැරදි ලෙස පුරාවස්තු ලඟ තබා ගැනීම, පුරාවිද්‍යා

| වර්ෂය | වාර්තා වූ සිද්ධීන් ගණන | නඩු පැවරීම් | පැවරීමට නියමිත | විමර්ශනය වන | අවසන් වූ නඩු |
|---|---|---|---|---|---|
| 2012 | 63 | 63 | - | 33 | 33 |
| 2013 | 76 | 74 | 2 | 48 | 26 |
| 2014 | 40 | 40 | - | 21 | 19 |
| 2015 | 26 | 22 | 4 | 11 | 19 |
| 2016 | 40 | 40 | - | 6 | 34 |
| **එකතුව** | **245** | **239** | **6** | **119** | **131** |

වගු අංක 1

**අනුරාධපුර පුරාවස්තු ආරක්ෂණ ඒකකයට වාර්තා වූ සිදුවීම්**

රක්ෂිතයන්ට ඇතුළු වීම හා ගිනි තැබීම්, පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ස්ථානයන්හි නව ඉදිකිරීම් සිදු කිරීම සහ පෞරාණික වටිනාකමක් සහිත බුදු පිළිම ආදිය විකිණීමට තැත්කිරීම සහ 1940 පුරාවස්තු ආඥාපනතින් සහ 1998 පුරාවස්තු (සංශෝධන) පනතින් නම් කර තිබෙන දේවල්ය. පසුගිය වසර පහ තුළ වාර්තාවූ තොරතුරු ඇසුරින් සිඳු කර තිබෙන වරදේ ස්වභාවයන් සම්බන්ධ විස්තර පහත සටහනින් දැක්වේ.




උරුමයන් වැනසීම සඳහා සිංහල බෞද්ධ පිරිස් බහුතරයක් සම්බන්ධවී තිබෙන අතර එය සංඛ්‍යාත්මක ව පන්සියතිස් අටකි. මුස්ලිම් ජාතිකයන් විසි දෙනෙක්, දමිළ ජාතීන් පස් දෙනෙකු සහ එක් කතෝලික ජාතිකයෙක් සම්බන්ධ වී තිබේ. සමස්ථ පැමිණිලි දෙසීය හතළිස් පහට අදාළ ව අත්අඩංගුවට ගෙන ඇති සැකකරුවන් සංඛ්‍යාව පන්සීය හැටහතරකි. එම සිඳුවීම්වලින් අනාවරණය වූ තවත් සාධකයක් වන්නේ එම විනාශයන් බහුතරයක් සිඳුකර ඇත්තේ කණ්ඩායම් සහභාගීත්වයෙනි. සමස්ථ තොරතුරු විශ්ලේෂණය කිරීමෙන් පසු අනාවරණය වුයේ 2013 වර්ෂයේ උරුමය වැනසීමේ ප්‍රවණතාවක් පැවත තිබේ. මෙම විනාශයන් වළක්වා ගැනීමට ප්‍රාදේශීය මට්ටමින් පවතින උරුමයන් පිළිබඳ මහජනයා දැනුවත් කර එය ආරක්ෂා කරගැනීමේ වැදගත්කම පිළිබඳව ඔවුන්ව දැනුවත් කිරීම, පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත වස්තූන් හා ස්මාරක පිහිටියා වූ ස්ථානවල අයිතිය පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් සතුබව සඳහන් කර තිබුණ ද එය මහජනයා සතු උරුමයක්ය යන හැඟීම ඔවුන් තුළ ජනිත කරලීමට විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, මහජනයා අතර පවතින මිථ්‍යාමත දුරලීමට අවශ්‍ය කරුණු ඉදිරිපත් කර ඒවා සනාථකර පෙන්වීම සහ ප්‍රදේශයේ පවතින ඉ පැරණි සංස්කෘතික වස්තූන් හා පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුතු ස්ථාන, ඒ සම්බන්ධයෙන් පවතින නීතිරීති ඇතුලත් ග්‍රන්ථයක් සකස් කර මහජනයා සතු කිරීම වැදගත්වන බව යෝජනා වශයෙන් ඉදිරිපත් කළ හැකි වේ.

### ආශ්‍රිත ග්‍රන්ථ


රාජපක්ෂ, අරුණ., 2000. 'අනාගත පරපුරින් අතීත උරුමය සොරා ගැනීමේ ප්‍රවණතාවය: ගැටළු සහ අභියෝග'. ***වැලිපිල පුරාවිද්‍යා සඟරාව***, සිව් වැනි කලාපය, 56-63, ඒකාබද්ධ පුරාවිද්‍යා උපාධිදාරී සංගමය, මධ්‍යම සංස්කෘතික අරමුදල

කපුකොටුව, ඇලෙක්සැන්ඩර්., 2012. 'නිධන් මිථ්‍යාවෙන් වැනසෙන අපේ උරුමය'. ***පුරාවිද්‍යා සමුළු වාර්තාව***, II වෙළුම, 347-395, ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ

වික්‍රමසිංහ, උදේනි., විජේසිංහ, හේමමාලි., 2013. 'පුරාවස්තු විනාශය පිටු දැකිමෙහිලා මහජන දායකත්වය ලබාගැනීම'. ***පුන්කලස***, III වෙළුම, 456-460, ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ

බාලසූරිය, විරාජ්, නෙරංජන්., 2008. 'අතීතය දායාද කළ අපේ උරුමයන් සුරකීමට දෙවන පෙළ සුදානම් ද?'. ***ජාතික පුරාවිද්‍යා සමුළුව***, 398-406, ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ

ගුණවර්ධන, ප්‍රිශාන්ත., 2005. ***'පුරාවිද්‍යා උරුමය ආකෘති, සංකල්ප සහ***